සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2018** **தரம் 11**
**FirstTerm Test 2018** **Grade 11**

**බුද්ධ ධර්මය I,II** ***කාලය පැය 3යි.***

බුද්ධධර්මය I කොටස

1. රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට මෙම නව අරහාදී බුදුගුණ පාඨය සඳහන් කෘතිය වන්නේ
   I. සුභාෂිතය යි III. ලෝවැඩ සඟරාවයි
   II. බුදුගුණාලංකාරයයි IV. කව්සිළුමිණයි
2. තමා විසින්ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය
   I. ඒහි පස්සික වේ III. සන්දිට්ඨික වේ
   II. ඕපනයික වේ IV. අකාලික වේ
3. අකිල තමා පාඩම් කරන කිසිම දෙයක් මතකයේ නොරැඳෙන බවත් නිදිමත ගතියක් ඇතිවන බවත් ගුරුතුමියට පැවසීය ඒ අනුව ඔහු තුළ ඇති විය හැකිවන්නේ
   I. ථීනමිද්ධය යි III. කාමච්ඡන්දය යි
   II. විචිකිච්ඡාව යි IV. ව්‍යාපාදයයි
4. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත කෘතියක් වන්නේ
   I. පාරමිතා ප්‍රකරණයයි III. අභිධර්ම මාර්ගයයි
   II. මුණිගුණාලංකාරයයි IV. පොහොය දිනයයි
5. මරණාසන්න මොහොතේදී සුගතියම දැක කලුරිය කළ පුද්ගලයෙකු වන්නේ
   I. ධම්මික උපාසකතුමාය III. චුන්ද සූකරය
   II. මට්ඨකුණ්ඩලීය IV. අදින්න පුබ්බකය
6. පුද්ගලයාගේ මරණින් මතු පළමු ආත්ම භවයේදීම විපාක දෙන කර්මය
   I. දිට්ඨධම්මවේදනීය කර්ම වේ
   II. උපපජ්ජවේදනීය කර්ම වේ
   III. අපරාපරිය වේදනීය කර්ම වේ
   IV. අහෝසි කර්ම වේ
7. බුදුරජාණන් වහන්සේ පස්වන වස් කාලය ගත කළේ කොහේදීද
   I. බරණැස ඉසිපතන මිගදායේය
   II. පාරිලෙය්‍ය වනයෙහිය
   III. විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහිය
   IV. සැවැත්නුවර වේළුවනාරාමයෙහිය

8. බුදුරජාණන් වහන්සේ පුද්ගලයෙකුට රෝග වැළැඳීමට හේතුවන කරුණු අටක් පෙන්වා දුන්නේ
   I. ස්වර්ණකාර හිමියන්ටය
   II. ගිරිමානන්ද හිමියන්ටය
   III. මහා කාශ්‍යප හිමියන්ටය
   IV. චුන්ද හිමියන්ටය
9. අවිධිමත්ව ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ ඒ අතර අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාරයට ගන්නා තරමට ගිජුවූ තැනැත්තා
   I. අලංසාටක වේ    III. භුත්තවමිතික වේ
   II. තත්ථාවට්ටක වේ    IV. ආහාර හත්ථක වේ
10. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුන් වහන්සේ තැන්පත් කොට ඉදිකරවන ලද ස්ථූපය වන්නේ
   I. සේරුවාවිල ස්ථූපයයි    III. රුවන්වැලි ස්ථූපයයි
   II. මහියංගණ ස්ථූපයයි    IV. ථූපාරාම ස්ථූපයයි

11. ලංකාවේ ඉදිකර ඇති කලාත්මක බවින් උසස්ම චෛතියඝරයට වටදාගෙයට උදාහරණයක් වන්නේ
   I. ථූපාරාම වටදාගෙයයි    III. අම්බස්තල වටදාගෙයයි
   II. ලංකාරාම වටදාගෙයයි    IV. මැදිරිගිරිය වටදාගෙයයි
12. භාරතීය මහා කාව්‍ය ලක්ෂණ පදනම් කරගෙන නිර්මාණය කරන ලද සිංහලයේ විශිෂ්ඨතම කාව්‍ය ග්‍රන්ථය වන්නේ කුමක්ද
   I. අමාවතුරය
   II. ධර්ම ප්‍රදීපිකාවය
   III. කව්සිළුමිණය
   IV. බුත්සරණය
13. දැහැමි රාජ්‍යයක රජු අධාර්මික ක්‍රියා ඇති නොවන අයුරින් කටයුතු කිරීම යන්න
   I. දස සක්විතිවත් වලට අයත් වේ
   II. දසරාජධර්මයට අයත් වේ
   III. සප්ත අපරහානීය ධර්මවලට අයත් වේ
   IV. සතර අගතිවලට අයත් වේ
14. අන් අයගේ සිත හඳුනා ගැනීමට ශක්තිය ඇති ඥානය
   I. පුබ්බේ නිවාසානුස්සති ඥානයයි
   II. චුතුපපාත ඥානයයි
   III. පරචිත්ත විජානන ඥානයයි
   IV. ආසවක්ඛ්‍ය ඥානයයි
15. බුදුරජාණන් වහන්සේ පළමු උදාන වාක්‍යය ලෙස හඳුන්වන්නේ
   I. අනේක ජාති සංසාරං ගාථාවය
   II. අග්ගෝ හමස්ථී ලෝකස්ස ගාථාවය
   III. හන්දදානි භික්ඛවේ පාඨයය
   IV. යථාපි මූලෙ අනුපද්දවේ දළ්හේ ගාථාවය
16. බෝසතාණන් වහන්සේට මුහුණදීමට සිදුවූ ප්‍රධානතම අභියෝගය වන්නේ
   I. තම දරුවා හා බිරිඳ අතහැර දමා යාමය
   II. දුක් සහිත පංචඋපාදානස්කන්ධය හඳුනාගෙන එය නැති කර දැමීමටය
   III. ප්‍රණීත ආහාර පානාදිය ලබාගැනීමටය
   IV. වේරංජා නුවර වස් තුන්මස යව ආහාර වැළඳීමටය

17. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ගිලන්වූ විට බුදුරජාණන් වහන්සේ ආරාමයට වැඩම කොට සප්ත බොජ්ඣංග ධර්ම දේශනා කළ සේක. මෙයින් අදහස් වන්නේ උන් වහන්සේ තුළ පැවැති
    I. අසරණ සරණ ගුණයයි
    II. පුරිසදම්ම සාරථී ගුණයයි
    III. ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණයයි
    IV. තාදී ගුණයයි
18. තමා හා වාද කිරීමට අයෙකු මෙතෙක් ලොව පහළ වී නැතැයි බුදුහිමියන් හමුවේ උදම් ඇනූ පුද්ගලයා නම් කරන්න
    I. බ්‍රහ්මායු බ්‍රහ්මයාය
    II. සච්චක නිගණ්ඨපුත්‍රයාය
    III. නිගණ්ඨනාථපුත්තය
    IV. දේවදත්ත හිමිය

19. කිසිවකුට හික්මවාලිය නොහැකි වූ පුද්ගලයන් දමනය කොට ඔවුන් යහමඟට ගැනීමට බුදුරජාණන් වහන්සේ සමත් වූහ. එම ගුණය සඳහන් කෘති දෙකක් වන්නේ
    I. අමාවතුර හා පූජාවලියයි
    II. අමාවතුර හා ධර්ම ප්‍රදීපිකාවයි
    III. අමාවතුර හා බුත්සරණයි
    IV. අමාවතුර හා බෝධිවංශයයි
20. ජේතවනාරාමය හා පූර්වාරාමය තනවා බුදුහිමියන්ට පූජා කරන ලද්දේ
    I. විශාඛා සිටුදේවිය හා බිම්බිසාර රජුය
    II. විශාඛා සිටුදේවිය හා අජාසත් රජුය
    III. අනේපිඬු සිටුතුමා හා විශාඛා සිටුදේවියයි
    IV. විශාඛා සිටුදේවිය හා අනේපිඬු සිටුතුමාය
21. බුද්ධ කාලීන භාරතයේ ගණතන්ත්‍ර පාලනයන් ක්‍රියාත්මක කළ වජ්ජී රජ දරුවන් විසින් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත වූයේ
    I. දස සක්විති වත්ය
    II. සප්ත අපරිහානි ධර්මයන්ය
    III. සතර සංග්‍රහ වස්තූන්ය
    IV. දස රාජ ධර්මයන්ය
22. ත්‍රිවිධ රත්නය පිළිබඳව කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම
    I. අවෙච්චප්පසාදයයි
    II. පැහැදීමයි
    III. අමූලික ශ්‍රද්ධාවයි
    IV. භක්තියයි
23. චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍ය යනු
    I. සිව්සස්ය
    II. සිව්පසය
    III. සිව් බඹ විහරණය
    IV. සිව්පිරිසය

24. අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණය සඳහන් සූත්‍ර දේශනාව වනුයේ
    I. අග්ගඤ්ඤ සූත්‍රයයි
    II. මහා පරිනිබ්බාණ සූත්‍රයයි
    III. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි
    IV. මහා මංගල සූත්‍රයයි
25. පසේ බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා විසින් පිරිය යුතු පාරමිතා ගණන
    I. දහයකි
    II. තිහකි
    III. විස්සකි
    IV. හතළිහකි
26. ප්‍රාණඝාතය ,අදත්තාදානය හා කාමමිථ්‍යාචාරය යන අකුසල් වලින් වැළකීම
    I. කායික ශීල සංවරයයි
    II. වාචසික ශීල සංවරයයි
    III. මානසික ශීල සංවරයයි
    IV. කායික හා වාචසික ශීල සංවරයයි

27. අප මහ බෝසතාණන් වහන්සේ පාරමිතා ධර්ම තිහක සම්පූර්ණ කළ සේක. ඒ අනුව නෙක්ඛම්ම පාරමිතාව පිරූ ආකාරය සඳහන් ජාතක කථාව නම්
    I. මඛාදේව ජාතකයයි
    II. සීල විමංස ජාතකයයි
    III. ක්ෂාන්තිවාදී ජාතකයයි
    IV. උම්මග්ග ජාතකයයි
28. නිවන් සොයා යන බෝසත්වරුන් විසින් සෝවාන් ආදී මාර්ගඵල ලබාගැනීමට දියුණු කරගත යුතු ප්‍රඥා නම්
    I. චින්තාමය ප්‍රඥාවයි
    II. භාවනාමය ප්‍රඥාවයි
    III. ලෞකික ප්‍රඥාවයි
    IV. ලෝකෝත්තර ප්‍රඥාවයි
29. චිත්ත සිතෙහි ස්වභාවය හා සිත දමනය කර ගැනීමෙන් සිදුවන යහපත පිළිබඳ දේශනා කර ඇති ධම්මපද ගාථාවක් වන්නේ
    I. අක්කොච්ඡි මං අවධි මං
    II. දූරංගමං ඒකචරං
    III. සුජීවං අහිරිකේන
    IV. අක්කොධේන ජිනේ කෝධං
30. යම්කිසි පුද්ගලයෙක් වස්තුවක් යම් ක්‍රියාවක් ගැන අප්‍රිය ස්වභාවය හෝ විරුද්ධ ස්වභාවය
    I. කාමච්ඡන්දයයි
    II. ව්‍යාපාදයයි
    III. ථීනමිද්ධයයි
    IV. විචිකිච්ඡාවයි

31. මෙලොව පරලොව දියුණුව සලසා ගැනීමට හේතුවන කරුණු 07 ක් පිළිබඳව සඳහන් වන ධම්මපද ගාථාව වනුයේ

    I. සුකරානි අසාධූනී ගාථාවය
    II. නතං කම්මං කතං සාධු ගාථාවය
    III. උට්ඨානවතෝ සතිමතෝ ගාථාවය
    IV. අක්කොච්ඡි මං අවධි මං ගාථාවය

32. සමථ භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ප්‍රයෝජනයක් නොවන්නේ මින් කුමක්ද

    I. මතක ශක්තිය දියුණු වේ
    II. ඉවසීමේ ශක්තිය වැඩිවේ
    III. ගැටලු විසඳීමේ ශක්තිය අවම වේ
    IV. වහා අවබෝධ කරගැනීමේ ශක්තිය දියුණු වේ

33. සම්බුදු සසුනත් රටත් ජාතියත් ආරක්ෂා කිරීමට උරදුන් පූජ්‍ය රේරුකානේ චන්‍දවිමල හිමිපාණන්ගේ ගිහි නම වූයේ

    I. කුලතුංග බණ්ඩාරය
    II. දොන් ඬේවිඩ් හේවාවිතාරණය
    III. පවුලිස් ගුණවර්ධනය
    IV. රූබෙල් ගුණවර්ධනය

34. පූජ්‍ය රේරුකානේ චන්ද විමල මහානාම හිමියන් විසින් රචනා කරන ලද පළමු ග්‍රන්ථය වන්නේ

    I. නිර්මාණ විනිශ්චයයි
    II. බෞද්ධයාගේ අත්පොතයි
    III. ධර්ම විනිශ්චයයි
    IV. පාරමිතා ප්‍රකරණයයි

35. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ

    I. ජාතක පොත් වහන්සේය
    II. සද්ධර්මරත්නාවලියයි
    III. ධම්මපදයයි
    IV. සද්ධර්මාලංකාරයයි

36. ත්‍රිවිධ රත්නයේ ගුණ ගණන දැක්වෙන්නනේ

    I. නවයක් ලෙසයි
    II. හයක් ලෙසයි
    III. විසිහතරක් ලෙසයි
    IV. විස්සක් ලෙසයි

37. බෞද්ධ ශික්ෂණයේ පදනම ලෙස සැලකෙන්නේ කුමක්ද

    I. භාවනාවයි
    II. ප්‍රඥාවයි
    III. සීලයයි
    IV. සමාධියයි

38. පංච අභිඥා හා අෂ්ට සමාපත්ති යන උසස් ධ්‍යානයන් ලබාගැනීමට වැඩිය යුතු භාවනාව ලෙස බුදු දහමේ දක්වා ඇත්තේ

    I. විදර්ශනා භාවනාවයි
    II. සතර සතිපට්ඨාන භාවනාවයි
    III. කායගතාසති භාවනාවයි
    IV. සමථ භාවනාවයි

39. කාලා රසමුසු භෝජන කර පෙම් යන කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක්ද

I. බුදුගුණාලංකාරයයි
II. ලෝවැඩ සඟරාවයි
III. කාව්‍ය ශේඛරයයි
IV. සුභාෂිතයයි

40. බුදුදහමෙහි ඉගැන්වෙන කුසල් යන්නෙහි නිවැරදිම අදහස වන්නේ

I. අදක්ෂ වැරදි නිරෝගි යන්නය
II. රෝගි වැරදි අදක්ෂ යන්නය
III. නිරෝගි නිවැරදි අදක්ෂ යන්නය
IV. නිවැරදි නිරෝගි දක්ෂ යන්නය

## බුද්ධ ධර්මය II කොටස

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමිවේ

1.

I. "සමග්ගා හෝථ මා විවදථ "යන්නෙහි සිංහල තේරුම ලියන්න
II. නිබද්ධ චාරිකා යන්නෙන් කුමක් අදහස් කෙරේද
III. පුරිස ධම්ම සාරථී ගුණය කෙටියෙන් දක්වන්න
IV. බුදුදහමේ ඉගැන්වෙන තුන්තරා බෝධිය නම් කරන්න
V. පංච මහා වාද පැවැත්වීමේ දී ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ තෙරුන් වහන්සේ නම කුමක්ද
VI. සම්බුදු සසුන බේරාගැනීමට තවත් විසිපහක් වතාවක් මේ දඹදිව ඉපදේවා යන පැතුම ඇතිව අපවත් වී වදාළ දෙස් විදෙස් පතළ භික්ෂූන් වහන්සේ ගේ නම ලියන්න
VII. බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය පැහැදිළි වන ජාතක කතාවක් නම් කරන්න
VIII. ධම්ම පදය අයත් වන්නේ සූත්‍රපිටකයේ කුමණ නිකායටද
IX. සීලය සම්පූර්ණ කිරීමේ දී ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් අංග තුනක් අනුව හික්මවිය යුතුය එම අංග තුන නම් කරන්න
X. බෞද්ධ භාවනාවේ සඳහන් වන ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න

2.

I. බෝසත් දිවිය මෙන්ම බුදු සිරිනද අභියෝග වලින් ගහන වූවකි. එම අභියෝග දෙකක් සඳහන් කරන්න
II. ඉන් එක් අභියෝගයක් කෙටියෙන් හඳුන්වන්න.
III. ශිෂ්‍ය ජීවිතයේදී විවිධ අභියෝග වලට මුහුණ දීමට සිදුවේ එම අභියෝග ජයගැනීමට ගතහැකි ආදර්ශ තුනක් විස්තර කරන්න

3.

I. බුදුරජාණන් වහන්සේ තුළ පැවති ගුණ සමුදාය අසීමිතය. ඔබ උගත් එබඳු ගුණ දෙකක් සඳහන් කරන්න
II. අටලෝ දහමෙහි අංග නම් කරන්න
III. "යමෙකු ගිලෙනකුට කරන උපස්ථානය බුද්ධෝපස්ථානයක් බව බුද්ධ දේශනාවයි" බුදු සිරිතද ආදර්ශයට ගනිමින් ඒ පිළිබඳව පැහැදිලි කරන්න

4.

I. බුද්ධ කාරක ධර්ම දහයකි එයින් දෙකක් නම් කරන්න
II. පාරමිතා ගුණධර්ම පුහුණු කරන්නෙක් පුහුණු කළ යුතු ගුණාංග පහකි ඉන් තුනක් ලියන්න

III. සදාචාරවත් ජීවිතයකට මෙන්ම සමාජ දිවියටද පාරමී ධර්ම වලින් ලැබෙන උපකාරය අතිශය වැදගත්ය. පැහැදිලි කරන්න

5.

I. තෙරුවන් ගුණ කීයද

II. අරහං බුදුගුණයෙහි අර්ථය කෙටියෙන් සඳහන් කරන්න

III. බෞද්ධ සමාජයක ගිහි පැවිදි සබඳතාවය ගසට පොත්ත මෙන් බැඳී පවතී. ඒ අනුව සංඝරත්නයෙන් සිදුවන ආගමික හා ජාතික සේවාව පිළිබඳ විස්තර කරන්න

6.

I. නිවන අහුරන ධර්ම නීවරණ යි. පංච නීවරණ ධර්ම වලින් දෙකක් කරන්න

II. සීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමුවන පුද්ගලයා තුල තිබිය යුතු ගුණාංග තුනකි. ඒ මොනවාද

III. සිසු දිවිය සාර්ථක කර ගැනීමට බෞද්ධ භාවනා ක්‍රම උපකාර කරගත හැකිය නිදසුන් සහිතව විස්තර කරන්න

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් ගැන කෙටි සටහන් ලියන්න

I. ධම්ම පදය

II. පූජ්‍ය රේරුකාණේ චන්ද විමල නාහිමි

III. සඳකඩ පහණ

IV. සීලය